මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: 2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513459, 2513498, 2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018 – 04 - 09

## ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජනය ඇ.ඩො 1.9ක වාර්තාගත වැඩිවීමක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා ඉතිහාසයේ වාර්තාගත වැඩිම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය 2017 වසර තුළ ලබාගෙන ඇත. 2017 වසර තුළ ශ්‍රී ලංකාවට ලැබී ඇති සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො බිලියන 1.9ක් හෙවත් රුපියල් බිලියන 290ක් පමණ වේ. මෙය 2016ට වඩා සිව් ගුණයක වර්ධනයකි. මීට පෙර වැඩිම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් වාර්තා වී තිබුණේ 2014 වසරේ දීය. එය ඇ.ඩො. බිලියන 1.7කි.

2017 වසරේ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට හම්බන්තොට වරාය බදු දීම වෙනුවෙන් ලද ඇ.ඩො මිලියන 300ක පළමු වාරිකය ද ඇතුළත් ය. චීන ආයෝජන මෙන් ම හොංකොං, ඉන්දියාව සහ සිංගප්පූරුව යන රටවල ආයෝජන ද මෙම වර්ධනීය තත්ත්වය අත්පත් කර ගැනීමට හේතු විය.

2015 සහ 2016 යන වසරවල සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය පිළිවෙළින් දැක් වූයේ ඇ.ඩො මිලියන 970ක් සහ ඇ.ඩො මිලියන 450ක් ලෙසිනි.

2017 වසරේ මෙම වර්ධනීය තත්ත්වය අත්පත් කර ගැනීමට හේතුවක් ලෙස රජය විසින් රට තුළ ව්‍යාපාරයන්ට හිතකර පරිසරයක් නිර්මාණය කර දීම ද දැක් විය හැකි ය. සරල බදු ක්‍රම හඳුන්වා දීම සේම සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ එක් දින සේවය වැනි දෑ පෙන්වා දිය හැකි ය.

එසේ ම ගෙවුම් ශේෂ ගැටලුව ස්ථිර ලෙස විසඳා ගැනීම සඳහා සෘජු ආයෝජන සහ අපනයන වැඩි කිරීමට ගෙන ඇති පියවර ද හේතු වී ඇත. 2017 වසර තුළ ශ්‍රී ලංකාවේ ආපනයනය ද වෙහෙවින් වැඩි වී ඇත. 2017 වසර ජනවාරියට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයනය 2018 ජනවාරි වන විට 11.6%න් එනම් ඇ.ඩො. 965.4 දක්වා වැඩි වී ඇත.

ඊට අමතරව විගමනික ශ්‍රමිකයන් විසින් එවනු ලබන ප්‍රේෂණ ප්‍රමාණය ද වැඩි වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය 2017 දෙසැම්බර් වන විට ඇ.ඩො. බිලියන 7.9 දක්වා ඉහළ ගියේ ය.

මෙම වසරේ අවසානයේ දී ඇ.ඩො බිලියන 2.5ක විදේශ ආයෝජන ලබා ගැනීමේ ඉලක්කය කරා ළඟාවීමට රජය සැලසුම් කර තිබේ. එය 2020 වනවිට ඇ.ඩො බිලියන 5 දක්වා වර්ධනය කිරීම රජයේ අපේක්ෂාවයි.

එම්.ඒ. හසන්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.